

# ‘රේඛාවේ’ පනස් වසර තුළ ලෙස්ටර්

ගුණසිරි සිල්වා

*ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් ‘රේඛාව’ චිත්‍රපටය නිර්මාණය කොට 50 වසරක් සපිරෙයි. ‘රේඛාව’ ලෙස්ටර්ගේ ප්‍රථම සිනමාපටය බැවින් ඊට පනස් වසරක් සපිරීම වනාහි ලෙස්ටර්ගේ සිනමා ජීවිතයට 50 වසරක් සපිරීමකි. එබැවින් ලෙස්ටර්ගේ සිනමා චින්තනය සහ භාවිතාව ලුහුඬින් හෝ විමසීමකට ලක්කිරීමට මෙය මහඟු අවස්ථාවකි.*

‘කඩවුණු පොරොන්දුව’ අපේ මුල්ම චිත්‍රපටය වුවද සැබෑ ලාංකේය සිනමාවක දොරගුළු විවර වන්නේ එදා ලෙස්ටර් ‘රේඛාව’ නිපදවීම සඳහා කළ විප්ලවයත් සමඟය. එතෙක් දැවැන්ත චිත්‍රාගාර ඇතුළත සිරවී සිටි සිංහල චිත්‍රපටය එළිමහනකට ගෙන ඒමට ලෙස්ටර් දැරූ ප්‍රයත්නය එදා සම්ප්‍රදායික සිනමාකරුවන්ගේ හාස්‍යයට ලක්වූයේය. එහෙත් විලී බ්ලේක් හරහා ලෙස්ටර් විසින් කැමරාවට හසුකරගනු ලැබූ ගස් වැල්, තුරුලතා, ගංගා, ඇළ දොල ‘රේඛාව’ තුළින් තිරය මත දිස් වෙද්දී අපේ පොලොවේ සුවඳත් සමඟ පියවි ලොවක පියවි ගැහැණුන් මිනිසුන්ගෙන් සමන්විත සජීවී සිනමාවක රුව ගුණ ප්‍රේක්ෂකයාට දැනෙන්නට විය.

සැබවින්ම මේ රටේ සිනමාවක් පිළිබඳ ශක්තිමත් අඩිතාලමක් දැමෙන්නේ ‘රේඛාව’ ඔස්සේය. චිත්‍රපට නාමයෙන් එතෙක් නිපදවුණු විසුක දස්සන වෙනුවට ‘රේඛාව’ තුළින් යථාර්ථවාදී සිනමාවකට අවශ්‍ය මං පෙත් පාදනු ලැබීය. ‘රේඛාව’ නිපදවා දස වසරක් ගෙවෙන්නටත් මත්තෙන් ලෙස්ටර් විසින්ම ‘ගම්පෙරළිය’ නිපදවීම ඔහු විසින් එළිපෙහෙලි කළ මග ඔස්සේ යථාර්ථවාදී සිනමා-වක මූල බීජ වැපිරීමක් විය.

‘ගම්පෙරළිය’ චිත්‍රපටයට විෂය වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ‘ගම්පෙරළිය’ නවකතාව සිංහල නවකතාවට යථාවර්ථවාදී රීතිය හඳුන්වා දුන්නා සේම. ‘ගම්පෙරළිය’ චිත්‍රපටය ද ලාංකේය සිනමා-වට යථාර්ථවාදී ගමනකට දොරගුළු විවරකර දුන්නේය.

ස්ත්‍රී-පුරුෂ ප්‍රේමාලාප- පවුල් අර්බුද ආදීය මතුපිට තලයෙන් ගෙන ප්‍රේක්ෂකයන් භාවතීෂය ලෙස හඬා වට්ටමින් සිනමාවේ නාමයෙන් එවකට පැවති විසූක දස්සන අනුව ලෙස්ටර් ‘ගම්පෙරළිය’ වැනි නවකතාවකට අතගැසීම සැබවින්ම භාරදූර කාර්යයකි.

‘ගම්පෙරළිය’ නවකතාව තුළ අන්තර්ගත සමාජ දර්ශනය චිත්‍රපටය තුළ ගැඹුරින් විවරණය නොකෙරුණද එබඳු සමාජ වටිනාකමක් ඇති පුවතක් සිනමාවට නැගීමෙන් ලාංකේය සිනමාවට එතෙක් නොතිබුණු වටිනාකමක්, ගැඹුරක් එක් කිරීමට ලෙස්ටර්ට හැකි විය.

‘ගම්පෙරළිය’ චිත්‍රපටියේ අන්තර්ගතයට අමතරව චරිත නිරූපනය-කැමරාකරණය-සංස්කරණය ඇතුළු සිනමාත්මක නිමාව සැබෑ සිනමා කෘතියක් පිළිබඳ ප්‍රබල මුද්‍රාවක් මෙන්ම පූර්වාදර්ශයක් ද විය.

සැබැවින්ම ‘ගම්පෙරළිය’ වැනි චිත්‍රපටයක් බිහිවන්නට තරම් ගුණාත්මක පසුබිමක් එවකට අපේ සිනමාව තුළ දිස්නොවීය.

‘කුමක්ද මේ ආශ්චර්යය! මේ ඔපපාතික කලා කෘතිය කෙසේනම් ප්‍රාදූර්භූත වූයේද?’ යනුවෙන් එදා ‘ගම්පෙරළිය’ බිහිවීම සම්බන්ධයෙන් මහාචාර්ය සරච්චන්ද්‍රයන් සිය විශ්මිතය පළ කළේ එබැවිනි.

‘ගම්පෙරළිය’ එම වසරේදී නවදිල්ලි ජාත්‍යන්තර සිනමා උළෙලේදී රණමයුර සම්මා-නයෙන් පිදුම් ලැබීමද අපේ සිනමාව ජාත්‍යන්තර තලයේ අවධානයට ලක්වීමට තරම් වැදගත්කමක් ඇති සිනමාවක් ලෙස ඇගැයීමට ලක්වීමකි.

‘ගම්පෙරළිය’ චිත්‍රපටයෙන් අනතුරුව ’රන්සළු’-‘දෙලොවක් අතර’-‘අක්කර පහ’- ‘ගොළු හදවත’- ‘දෑස නිසා’- ‘බැද්දේගම’- ‘පුරන් අප්පු’- ‘නිධානය’-‘කලියුගය’- ‘යුගාන්තය’ ආදී චිත්‍රපට ඔස්සේ වූ ලෙස්ටර්ගේ සිනමා චාරිකාව තුළ සුවිශේෂ මං සලකුණු ලෙස ඉස්මතු වන්නේ ‘ගොළු හදවත’ ‘දෙලොවක් අතර’ ‘නිධානය’-‘කලියුගය’ ආදී චිත්‍රපටයි. එම චිත්‍රපට අතර ‘ගොළු හදවත’ සහ ‘දෙලොවක් අතර’ සිනමාමාධ්‍ය භාවිතය පැත්තෙන් ඉදිරි පිම්මක් පෙන්නුම් කළ අතර, ‘නිධානය’ සිනමා භාවිතය පැත්තෙන් මෙන්ම ලෙස්ටර්ගේ චින්තනය පැත්තෙන් ද අතිශය පරිණත බවක් පෙන්නුම් කිරීමක් විය.

පූර්ණ වැඩවසම්වාදය පුපුරුවා නොහැර- ඒ මතම ලාංකේය නව ධනේශ්වරය බිහිකරලීමේ අනිශ්ඨ විපාක ලෙස නිදන්ගතව පවතින රූදල වැඩවසම්වාදයේ නෂ්ඨාවශේෂ පුද්ගල ආත්මයන් කෙරෙහි බලපාන අයුරු ‘නිධානය’ තුළ සියුම් විග්‍රහයකට ලක්කරන අතරම, ‘කලියුගය’ තුළින් මේ රටේ මැද පන්තියේ නැගීම සහ ඒ පිටුපස පවතින සංස්කෘතික බේදය ලෙස්ටර් දකින්නේ සැබෑම චින්තකයෙකු ලෙසිනි.

1956 ‘රේඛාවේ’ සිට 1982 දක්වා වූ 26 වසර ලෙස්ටර්ගේ සිනමා චින්තනය සහ භාවිතාවේ සාධනීය ලක්‍ෂණ ඉහළින්ම පෙන්නුම් කළ කාලපරිච්ජේදයක් වූ අතර, ඔහුගේ ඒ චින්තනය සහ භාවිතාව තුළ කෙමෙන් කඩතොලු මතුවන්නේ ‘යුගාන්තය’ චිත්‍රපටයත් සමඟය. එහි උච්චම අවස්ථාව වන්නේ ‘අවරගිර’ සහ ‘වෑකන්ද වලව්ව’ යන චිත්‍රපට දෙකයි.

‘යුගාන්තය’ සිනමාපටයේ සිට ‘අවරගිර’ සහ ‘වෑකන්ද වලව්ව’ දක්වා වූ ලෙස්ටර්ගේ සිනමා භාවිතාව අවපස දක්වා ගමන් කිරීම තුළ දැකිය හැකි වන්නේ ඔහුගේ චින්තනයේ පසු බැස්මකි. මෙය ලෙස්ටර්ගේ සිනමාව තුළ පමණක් දැකිය හැකි ලක්ෂණයක් නොව, ඔහුගේ පුරෝගාමී සෙවණේ හැදුණු වැඩුණු 70 දශකයේ සහ 80 දශකයේ මුල් භාගයේ සිනමාකරුවන්ගේ කෘති තුළත් දැකිය හැකි පොදු ලක්ෂණයකි.

ධර්මසේන පතිරාජ ‘අහස් ගව්වේ’ සිට ‘සොල්දාදු උන්නැහේ’ දක්වා ලාංකේය සිනමාව තුළ සිදු කළ දැවැන්ත දේශපාලනමය කාර්යභාරය ‘මතුයම් දවස’ චිත්‍රපටයත් සමඟ අවසන් වීම, වසන්ත ඔබේසේකර ‘පළඟැටියෝ’ සිට ‘කැඩපතක ඡායා’ දක්වා වූ නිර්මාණ තුළ ගෙන ගිය සමාජ කතිකාව ‘තීර්ථ යාත්‍රා’ චිත්‍රපටයත් සමඟ අභාවයට යෑම, ධර්මසිරි බණ්ඩාරනායක ‘හංස විලක්’ සිට ‘සුද්දිලාගේ කතාව’ දක්වා ගෙන ගිය පුද්ගලයා සහ සමාජය අතර වන මනෝ විශ්ලේෂණාත්මක කතිකාව ‘බව දුක’ සහ ‘බව කර්ම’ තුළින් අභාවයට යෑම, අපේ පුරෝගාමී සිනමාකරුවන්ගේ සිනමා චින්තනය අර්බුදයකට යෑම පෙන්නුම් කරන පොදු ලක්‍ෂණයකි. මේ පොදු ලක්‍ෂණය තුළ දැකිය හැකි වන්නේ 80 දශකයෙන් පසු අද දක්වා උත්සන්න වී ඇති මෙරට සමාජ කලබගෑනිය නිසි ලෙස විග්‍රහ කරගෙන නිර්මාණ කාර්යයට අත පොවන්නට තරම් ඉදිරි දැක්මක් ඔවුන් තුළ නොමැති වීම නො-වන්නේද? වෙනත් වචනවලින් සඳහන් කරන්නේ නම් සමාජ-ආර්ථික-දේශපාලන සහ සංස්කෘතික වශයෙන් දැවැන්ත අර්බුදයකට ලක්ව බැරෑරුම් යුද්ධයක් අභිමුව පවතින රටක සීග්‍රයෙන් වෙනස්වන යථාර්ථය ඉදිරියේ මේ කලාකරුවන් වික්ෂිප්තව සිටින සැටියකි.

ලෙස්ටර්ලා-පතිරාජලා-වසන්තලා-ධර්මසිරිලා එතෙක් ගෙනගිය සිනමා කතිකාව අතික්‍රමණය කරමින් නිර්මාණකරණයට බට ප්‍රසන්න විතානගේ, අශෝක හඳගම, විමුක්ති ජයසුන්දර, ඉනෝකා සත්‍යාංගනී ආදී නව පරපුරේ සිනමාවේදීන් අද දවසේ


පතිරාජ

දේශපාලනය ඉව අල්ලන්නට පරිශ්‍රම දරණු දැකිය හැකිය.

යුද්ධයක් අභිමුඛව මේ රටේ සමාජ-ආර්ථික-දේශපාලන සහ සංස්කෘතික පරාසයන් සියල්ල කුණුවී සැරව ගලන තත්ත්වයක සිට නිර්මාණය කරන්නට සිදුවී ඇති හඳගමලා-විමුක්තිලා-ඉනෙ-ා්කලා-ප්‍රසන්නලා අත ගසා සිටින සමාජ කාර්යයයේ ප්‍රතිඵල වඩාත් තියුණු සහ විවෘත ඇසකින් දකින්නට හැකිවනුයේ දැනට සැරව ගලමින් පවතින මේ සමාජ ආර්ථික දේශපාලන හා සංස්කෘතික තුවාලය සුවපත් කළ හැකිවූ වැඩපිළිවෙලක ප්‍රතිඵල භුක්තිවිඳින අවස්ථාවකදී ය. එතෙක් මේ කුණුවී ගඳ ගහන සමාජ සංස්ථාවන්ගෙන් ඔවුන්ගේ නිර්මාණ වෙත එල්ල කරන ප්‍රහාර නොනවතිනු ඇත.

අනුග්‍රහය ලංකා ඊ නිව්ස්

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent
ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය
Services
- Individual/ Business Tax Returns(ELS) (Refunds within 14 days)
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Presonal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.
Office
1/1324 Center Rd, Clayton 3169
TP 03 9544 4995
Fax 03 9544 4997
After Hours
7 Whitton Court, Rowville 3178
P/F 03 9755 7400
M 0402 846 676
leadtax@iprimus.com.au
PNA
NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS